CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

අතින් හෝ ලියාපදිංචි තැපෑලෙන්

2019 ජුනි 21

චන්දන දීපාල් වික්‍රමරත්න මහතා,
වැඩබලන පොලිස්පති / ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 00100.

මහත්මයාණෙනි,

**<u>අස්ගිරිය පාර්ශවයේ මහනායක හිමියන් විසින් කළ ජාතිවාදී හා ආගම්වාදී ප්‍රකාශ සම්බන්ධයෙන් විමර්ශනයක් ඉල්ලා සිටීම</u>**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) මෙම ලිපිය ඔබට ලියන්නේ පසුගිය වසර කිහිපය තුළ මතු වූ සුළු ජාතීන් ඉලක්ක කර ගත් ආගමික ගැටුම් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ය. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසු මුස්ලිම් ප්‍රජාවට එරෙහි ගැටුම් සහ ප්‍රචණ්ඩත්වයන් විශාල ලෙස වර්ධනය වී තිබේ. මෙම ප්‍රචණ්ඩ ක්‍රියා සහ නොඉවසීම නිසා අපේ රටේ ස්ථාවරත්වය අඩපණ වී ඇත.

මෙම සන්දර්භය තුළ, 2019 ජුනි 16 වන දින හෝ ඊට ආසන්න දිනක අස්ගිරිය පාර්ශවයේ මහ නාහිමි පූජ්‍ය වරකාගොඩ ඥානරතන ස්වාමීන් වහන්සේ විසින් කරන ලද කථාව ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීමක් විය හැකිය. මහ නාහිමියන්ගේ අදහස් යූ ටියුබ් හරහා [ඇමුණුම 1] ලබා ගත හැකි අතර 2019 ජුනි 17 වන දින දිවයින පුවත්පතේ අන්තර්ජාල සංස්කරණයේ ද අඩංගු විය [ඇමුණුම 2].

මහ නාහිමියන් තම කථාවේදී මෙසේ දක්වයි:

1. වස විෂ අන්තර්ගත බැවින් ජනතාව මුස්ලිම් කඩවල් වලට යාම හෝ ඔවුන් විකුණන ආහාර නොගත යුතුය.
2. මුස්ලිම් කඩවල් ශ්‍රී ලංකා බෞද්ධ ජනතාව විනාශ කිරීමට උත්සාහ දරයි.
3. කිහිප දෙනෙකු පවසන ලද්දේ දහස් ගණනක් වූ "අපේ දරුවන්" විනාශ කළ වෛද්‍යවරයා ගල් ගසා මරා දැමිය යුතු බවයි. නාහිමියන් පවසන්නේ "නමුත් මම එසේ කරන්නැයි කියන්නේ නැහැ. ඒත් කළ යුත්තේ එයයි" කියායි.
4. නීතිය ක්‍රියාත්මක නොවේ නම්, සිංහල බෞද්ධයන් එකමුතු විය යුතුයි.

මහ නාහිමියන්ගේ කථාව ඍජුවම මුස්ලිම් ව්‍යාපාර ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාවේ මුස්ලිම් පුරවැසියන්ට එරෙහිව දැනටමත් දැල්වී ඇති භීතියේ හා වෛරයේ ගිනිදැල් පෝෂණය කරයි. මෙම කථාව තුළ දැනට විමර්ශනය කරමින් සිටින මුස්ලිම් වෛද්‍ය වෘත්තිකයෙකු ඉලක්ක කර ඇති අතර මරණය තෙක් ගල් ගැසීම සම්බන්ධයෙන් වෙනත් අය කරන ප්‍රකාශයන් ගැන ද සඳහන් කරයි. මෙය ඕනෑම අවස්ථාවක අතිශය භයානක ප්‍රකාශයක් වන අතර, වර්තමානයේ රට තුළ උත්සන්න වී ඇති තත්ත්වය සැලකිල්ලට ගත් විට උසිගැන්වීමක් සේ සැලකිය හැකි වේ.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 05, Sri Lanka
Tel: +94 11 2081384-6, 5552746, 5552748 | Fax: +94 11 2081388 | Email: cpa@cpalanka.org | Web: www.cpalanka.org

පසුගිය මාස දෙක තුළ ඇතිවූ ප්‍රචණ්ඩත්වයන් සැලකිල්ලට ගනිමින්, මෙම ප්‍රකාශය විමර්ශනය කිරීමට සහ අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නෛතික බලධාරීන් ඉක්මන් පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. වාර්තා වී ඇති පරිදි, දැනටමත් මීට වඩා දරුණු බවින් අඩු ප්‍රකාශයන් කළ බොහෝ පුරවැසියන් ප්‍රශ්න කිරීම් වලට ලක් කොට තිබේ. මෙම විශේෂ සිද්ධිය හමුවේ අකාර්යක්ෂමතාවයක් හෝ බලධාරීන් විසින් පුරවැසියන් හා පූජ්‍ය පක්ෂය වෙත වෙනස් ප්‍රමිතීන් දක්වයිද යන්න පිළිබඳව ගැටළු මතු වේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යළිත් අවධාරණය කරන්නේ නීතිය සියලු දෙනාටම එක හා සමානව, බියකින් හෝ අනුග්‍රහය දැක්වීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතු බවයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර ද බලධාරීන්ට ලිපියක් යවා ඇත්තේ විමර්ශනය කළ යුතු සහ නඩු පැවරිය හැකිව තිබූ අදාළ නීති ඉස්මතු කරමිනි. මෙම සිද්ධියට අදාළ වන බව අපට උපදෙස් දී ඇති පහත සඳහන් නීතිමය විධිවිධාන කෙරෙහි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවත වරක් ඔබේ අවධානය යොමු කරවයි:

- **දණ්ඩ නීති සංග්‍රහයේ 291 (අ) වගන්තියේ**, "කිසිවකු විසින්, ඕනෑම පුද්ගලයෙකුගේ ආගමික හැඟීම් රිදවීමේ චේතනාවෙන්, එම පුද්ගලයාට ඇසෙන පරිදි ඕනෑම වචනයක් උච්චාරණය කිරීම හෝ යම් ශබ්දයක් කිරීම හෝ ඔවුන් ඉදිරියේ කිසියම් ඉඟියක් කිරීම, හෝ ඉදිරියේ කිසියම් වස්තුවක් පෙනෙන සේ තැබුවහොත්, වසරක් දක්වා දීර්ඝ කළ හැකි කාල සීමාවක් යටතේ සිරගත කිරීමක් හෝ දඩයක් හෝ දෙකම සමඟ <u>දඬුවම් ලැබිය යුතුය.</u> "

- **2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR)** පනතේ **3 වන වගන්ති** ප්‍රකාරව,

  *"3. (1) කිසිදු පුද්ගලයෙක් යුද්ධය ප්‍රචාරණය කිරීම හෝ වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට පොළඹවන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී නොසිටිය යුතුය."*

  *(2) (අ) උත්සාහ කරන සෑම පුද්ගලයෙකුම; (ආ) ආධාර හෝ අනුබල දීම මගින් ; හෝ (ඇ) සිදු කරන බවට තර්ජනය කිරීම, (1) වන උපවගන්තියේ සඳහන් පරිදි වරදක් වන අතර මෙම පනත යටතේ වරදක් වශයෙන් වැරදිකරු වේ.*

අවසාන වශයෙන්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඔබ ඉදිරියේ තබමින් "ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ එවැනි පදනමක්" නොසලකා සියලු පුද්ගලයින්ට එක හා සමානව සැලකීම ඔබේ යුතුකම බව සිහිපත් කරයි.

පවත්නා සාක්ෂි අනුව, මෙම සිද්ධිය සම්බන්ධයෙන් ක්ෂණික පරීක්ෂණයක් ආරම්භ කිරීමට සහ පුද්ගලයන්ට වගවීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට නීතියෙන් ඔබේ කාර්යාලයට ප්‍රමාණවත් බලතල ලබා දී ඇති බව පෙනේ.

ඔබේ නීතිමය බැඳීම් ඉටු කරන ලෙසත්, නීතියෙන් දක්වා ඇති පරිදි මෑත කාලීන ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ සියලු දෙනා වගකිව යුතු නිසා දැනට පවත්නා නීති රාමුව ඊට භාවිතා කරන ලෙසත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඔබෙන් ඉල්ලා සිටී. (අ) මේ රටේ අපරාධ නීතිය වරණීයව ක්‍රියාත්මක නොවන බවත් (ආ) නඩු පැවරීමෙන් ගැලවී සිටීමට හැකි සමහර පුද්ගලයන් අතින් අපරාධ සිදුවීම වැලැක්වීම වන බවත් පුරවැසියන්ට පෙන්වා දීම සඳහා මෙය සිදුකිරීම අත්‍යවශ්‍ය වේ. එවැනි සහතිකයක් නොමැතිව කිසි විටෙකත් සැබෑ, විනීත හා ගෞරවනීය සාමය හා සමගිය හෝ සමාජ ස්ථාවරත්වයක් තිබිය නොහැකි බව ඔබ ද පිළිගනු ඇත. පියවර ගැනීමට ප්‍රමාදවීම හෝ අපොහොසත් වීම එවැනි ආරක්ෂාවක් සහතික කිරීම වළකාලයි. <u>**එමනිසා, මෙය ලැබුණු දින සිට සති දෙකක් ඇතුළත ඔබ මෙම ලිපියට ප්‍රතිචාර දැක්වීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අගය කොට සලකයි.**</u>

මෙයින් ඉල්ලා ඇති පරිදි කඩිනම් පියවර ගැනීමේ අතිශය වැදගත්කම සැලකිල්ලට ගනිමින් මෙම ලිපියේ පිටපතක් ජනාධිපති, අගමැති සහ නීතිපති වෙත යවනු ලැබේ. මහජන යහපත උදෙසා මෙම ලිපිය මාධ්‍යයට ද නිකුත් කෙරේ.

ස්තුතියි.

මෙයට විශ්වාසී,



ආචාර්ය පී. සරවනමුත්තු,
විධායක අධ්‍යක්ෂක,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

පිටපත්: මෛත්‍රීපාල සිරිසේන, ගරු ජනාධිපති, ජනාධිපති ලේකම් කාර්යාලය, ගාලු මුවදොර, කොළඹ 01.

රනිල් වික්‍රමසිංහ, ගරු. අග්‍රාමාත්‍ය, අංක 58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.

දප්පුල ද ලිවේරා, නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, තැ. පෙ. අංක 502, හල්ෆ්ට්ස්ඩෝර්ප්, කොළඹ 12.